# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1822/21 - 2013 අගෝස්තු මස 07 වැනි බදාදා - 2013.08.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාත් සභාව

අංක 1793/6-2003 ජනවාරි මස 16 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 4 වැනි වගන්තිය සංශෝධනය කිරීම

අංක 1793/6-2013 ජනවාරි මස 16 වැනි දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 04 වැනි වගන්තිය 2013.08.01 වැනි දින සිට පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

04. 2011 අංක 2 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 3(අ)iii උප වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කටයුතු අත්හිටුවා ඇති හෙයින්, එහි බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යය ඉටුකිරීමට ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් වන මලේ පතිරණගේ නිශාන්ත මොහාන් වික්‍රමසිංහ මහතාගේ පත්කිරීම 2013.07.31 දින සිට අවලංගු කරන අතර, 2013.08.01 දින සිට ඒ වෙනුවට බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් රත්නායක මුදියන්සේලාගේ ජයවර්ධන මහතාට විධාන කරනු ලැබේ.

ශෂීන්ද්‍ර රාජපක්ෂ,
ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන,
සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග,
ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන
හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය.

08-748

---

### සංශෝධනයයි

### දකුණු පළාත් සභාව

2013.04.22 දිනැති අංක 1807/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (අ) වැනි කොටසෙහි පළාත් සභා නිවේදන (නගර සභා), දකුණු පළාතේ පළාත් සභාව යන ශීර්ෂය යටතේ පිටු අංක 2Aහි පළ කරන ලද නිවේදනයේ "තවද,

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193(2)(ඌ) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද නගර සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම් දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2012.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ." ලෙස මුද්‍රණ දෝෂයකින් පළවී ඇත.

එය "තවද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193(2)(ඌ) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද නගර සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම් දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2012.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ." ලෙස සංශෝධනය විය යුතු ය.

ගුණතිලක්‍ෂ වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය,
දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය.

2013 ජුනි මස 14 වැනි දින,
ගාල්ල, දකුණු පළාත් සභාවේ,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන,
ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

08 - 749

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.